# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120
ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1450/ 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023 திகதி
දිනය / Date: 19/11/2023 පැය 1510

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - ඉපලෝගම පොලිස් වසම.

2023.11.18 වන දින රාත්‍රී කාලයේ ඉපලෝගම පොලිස් වසමේ පලුගස්වැව ප්‍රදේශයේ නිවසක පහරදීමකින් පුද්ගලයෙකු මියගොස් ඇති බවට ඉපලෝගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ පලුගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් පවුල් ආරවුලක් හේතුවෙන් බිරිඳට පහරදී, කැත්තක් රැගෙන බිරිඳ පසුපස ලුහුබඳිමින් සිටියදී බිරිඳ නිවසේ කාමරයක් තුලට ගොස් එහි තිබූ දොර පොල්ලකින් පුරුෂයාගේ හිසට පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා මියගොස් ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණ වී ඇත.

වයස අවුරුදු 47 ක් වූ සැකකාරිය අත්අඩංගුවට ගෙන ඇති අතර ඉපලෝගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - කළුතර දකුණ පොලිස් වසම.

2023.11.18 වන දින රාත්‍රී කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ ගාල්ල කොළඹ මාර්ගයේ ලංකා බැංකුව අසල ඇති පදික මං තීරුව මතදී ගාල්ල දෙස සිට කොළඹ දිශාවට ධාවනය කරමින් තිබූ මෝටර් රථයක පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා නාගොඩ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුර සම්බන්ධයෙන් මෝටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **මාරක රිය අනතුරක් - දෙහිවල පොලිස් වසම.**

2023.11.18 වන දින උදෑසන කාලයේ දෙහිවල පොලිස් වසමේ දෙහිවල කළුබෝවිල රෝහල් මාර්ගයේ ඇති පදික මංතීරුව මතදී විලියම් හන්දිය දෙස සිට කළුබෝවිල දෙසට ධාවනය කරමින් තිබූ ත්‍රී රෝද රථයක පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කළුබෝවිල රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 88 ක් වූ කළුබෝවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුරට සම්බන්ධ ත්‍රීරෝද රථයේ රියදුරු අනතුරින් පසු පලාගොස් ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**